# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,510 - 2026 ඔක්තෝබර් මස 09 සිකුරාදා - 2026.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |


*සැ.යු.*: සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත 2026.10.02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ඔක්තෝබර් මස 30 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ඔක්තෝබර් මස 16 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


0000 - B 82837 - (2026/10)
E - 01



SINCE 2014
Gazette.lk
AMBITIONS REALIZED

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබූවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙළින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

#### නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය. මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 නොවැම්බර් මස 09 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | කොත්මලේ | කොත්මලේ කොට්ඨාසයේ කලපිටිය මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

10 - 447

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය. මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

Gazette.lk

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 නොවැම්බර් මස 09 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | නුවරඑළිය | කඳපොල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

10 - 448

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

**මහනුවර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර, ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය. මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 නොවැම්බර් මස 09 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යොමුකළ යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩුනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාසයේ එළමල්දෙණිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

10 - 449

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**කෑගල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 නොවැම්බර් මස 09 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 28 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | මාවනැල්ල | කුඹල්ගම කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ ගල්බඩ කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |

10 -450

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 නොවැම්බර් මස 04 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 28 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යොමුකළ යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | හගුරන්කෙත | හෝප්වත්ත ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

10 - 451

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**පුත්තලම දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.***- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 නොවැම්බර් මස 09 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 22 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යොමුකළ යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | පල්ලම | පල්ලම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා දෙමළ හත්පත්තුව කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |
| පුත්තලම | ආණමඩුව | කරඹෑපත්තුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා දෙමළ හත්පත්තුව කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |
| පුත්තලම | කල්පිටිය | සේතාපොල නාවක්කඩු කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා පුත්තලම් පත්තු කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

10 - 452

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. (පුරප්පාඩු ගණන 01කි.)

**1. බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් :-**

1.1 අධ්‍යාපන සුදුසුකම් : නීති විෂයයට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

1.2. වෘත්තීය සුදුසුකම් : ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

1.3. පළපුරුද්ද : ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු අපරාධ නඩු කටයුතු පිළිබඳ වසර 15 කට නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

1.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

1.5. වෙනත් සුදුසුකම් :
- i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
- ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**2. වයස :-** - **අවම සීමාව අවු: 40**
- **උපරිම සීමාව අවු: 54**

**3. වැටුප් පරිමාණය :-** රු. 212,000.00 – 10 x 4,950 - රු.261,500.00

ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් කේතය AC-E4-2025 වන අතර, ආරම්භක වැටුප් පියවර රු.212,000/- වේ. මීට අමතරව පාර්ලිමේන්තුව විසින් 2026.03.17 තනතුරට අදාළ වන පරිදි අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. (2027.01.01 දිනට පෙර බඳවා ගතහොත් වැටුප් ගෙවනු ලබන්නේ වැටුප් පරිමාණයට අදාළ උපලේඛන II අනුව වේ. එනම් ගෙවන වැටුප රු. 183,300.00 වේ.)

**4. බඳවා ගැනීමේ ක්‍රමය :-**

**4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා පත්කර ගනු ලැබේ.**

**4.1.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | 60 |
| අතිරේක සේවා පළපුරුද්ද | 10 | |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 10 | |
| අධිකරණ කටයුතු පිළිබඳ නිර්දේශ | 30 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 30 | |
| මුළු ලකුණු | 100 | |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

**4.1.2.** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සාමාජිකයින් තිදෙනකුගෙන් සමන්විතය.**

**4.1.3.** සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම කුසලතාවය දක්වන අයදුම්කරු තනතුරට බඳවා ගනු ලැබේ.

4.1.4. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

**5. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :-**

i. මෙම පත්වීම අංක 2504/07 හා 2026.09.01 දිනැති *ගැසට්* නිවේදනය මගින් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානවලට යටත් වේ.

ii. මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාර අරමුදල් ප්‍රතිලාභ හිමිය.

iii. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

iv. පරිවාස කාලය අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වීම හා සතුටුදායක හෝ ඊට ඉහළ කාර්‍යසාධන මට්ටම සළකා බලා සේවය ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

v. කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙනු ලබන කාර්ය සාධන ඇගයීම් දර්ශක අනුව වාර්ෂිකව ඔබගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරේ. ඒ අනුව ඉදිරි වැටුප් වර්ධක ලබා දීම සිදු වේ.

vi. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් පරිවාස කාලය තුල නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

vii. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත, අංක 2504/07 හා 2026.09.01 දිනැති ගැසට් නිවේදනයෙහි ඇතුළත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා රීති, ආයතන සංග්‍රහය II, මුදල් රෙගුලාසි හා වරින්වර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පනවනු ලබන රීතිවලට සහ චක්‍රලේඛවලට මෙම පත්වීම යටත්ය.

viii. බඳවා ගැනීමේ මාධ්‍ය ඉංග්‍රීසි මාධ්‍ය වේ.

ix. සේවා අවශ්‍යතාවය පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සිදු විය හැකි ය.

**6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-**

i. ඉහත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ :-

(*අ*) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය;

(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය.

**7. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-**

i. අයදුම්පත්, අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනය සඳහන් කර 2026 .11.09 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

iii. අයදුම්පත් බහා එවන ලිපි කවරය ඉහළ වම් කෙළවරේ "අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

iv. අයදුම්පත්‍රයෙහි අයදුම්කරුගේ අත්සන සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රජයේ ආයතනයක විධායක නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

v. අයදුම්පත් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදු විය හැකි ප්‍රතිවිපාක තමන් විසින්ම විඳදරා ගත යුතු ය.

vi. අයදුම්පත්‍රය සමග පහත ලේඛනවල සහතික කරන ලද එක් ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර, වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය.

(*අ*) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත;

(*ආ*) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත;

(*ඇ*) ඉහත අයදුම්පත්‍රයේ සඳහන් සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත්.

*සටහන.-* සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථ කර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**8.** **සාවද්‍ය තොරතුරු සැපයීම :-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**9.** පුරප්පාඩු පිරවීම / නොපිරවීම පිළිබඳ අවසාන තීරණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වේ.

**10.** මෙම බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

**11.** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ආර්.එස්.ඒ.දිසානායක,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 සැප්තැම්බර් මස 30 වැනි දින.
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
තැ.පෙ. 1431,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

*වැඩි විස්තර සඳහා අමතන්න:*
දුරකථන අංකය : 011-2582864
විද්‍යුත් තැපැල : da@ciaboc.gov.lk

(*කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි*)

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
**විවෘත පදනම මත අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත**

මාධ්‍ය
ඉංග්‍රීසි

**(අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතු ය)**

| | | |
|---|---|---|
| 1.0 | 1.1. සම්පූර්ණ නම | |
| | 1.2. සම්පූර්ණ නම (සිංහල / දෙමළ) | |
| | 1.3. මුලකුරු සමග නම | |
| 2.0 | 2.1. ස්ථිර ලිපිනය | |
| | 2.2. දිස්ත්‍රික්කය | |
| | 2.3. පළාත | |
| 3.0 | 3.1. ස්ත්‍රී/ පුරුෂ භාවය | |
| | 3.2. ජාතික හැඳුනුම්පත් අංකය | |
| 4.0 | 4.1. ජංගම දුරකතන අංකය/whatsapp අංකය | |

| | | |
|---|---|---|
| | 4.2. ස්ථාවර දුරකතන අංකය | |
| | 4.3. විද්‍යුත් තැපැල | |
| 5.0 | 5.1. උපන් දිනය | |
| | 5.2. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස | අවු: මාස: දින: |
| 6.0 | 6.1. විවාහක / අවිවාහක බව | |
| 7.0 | 7.1. ජාතිය | |
| 8.0 | 8.1. ආගම | |

**9.0 අධ්‍යාපන සුදුසුකම්: භාෂා මාධ්‍ය: ..................................................................**

**9.1 හදාරා ඇති පශ්චාත් උපාධි පිළිබඳ විස්තර :**

| *පශ්චාත් උපාධියේ නම* | *විෂය ක්ෂේත්‍රය* | *විශ්ව විද්‍යාලය/ ආයතනය* | *පන්ති සාමාර්ථය* | *පශ්චාත් උපාධිය වලංගු දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

**10.0 වෘත්තීය සුදුසුකම් :-**

.......................................................................................................................................................
.......................................................................................................................................................

**11.0 පළපුරුද්ද:-**

| *විෂය ක්ෂේත්‍රය* | *ආයතනය* | *කාලය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

**12.0. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :-**

| ප්‍රවීණතාවය තහවුරු කළ හැකි ලේඛන |
|---|
| 1. |
| 2. |
| 3. |

**13.0 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :-**

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

**14.0 වෙනත් සුදුසුකම් :**

..................................................................................................................................................

..................................................................................................................................................

**15.0 අයදුම්කරුගේ/** අයදුම්කාරියගේ ප්‍රකාශය:

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් වැරදි හෝ සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව හෝ හෙළි වුවහොත් මාගේ අපේක්ෂකත්වය/ හෝ පත්වීම අවලංගු කිරීමේ අයිතිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් **සභාව සතු බව දනිමි.**

**මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් පවතින නීති රීතිවලට බැඳී සිටීමට හා නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත් බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව මාගේ අපේක්ෂකත්වය/ හෝ පත්වීම අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට යටත් වන බවට මම එකඟ වෙමි.**

............................................................,
**අයදුම්කරුගේ/** අයදුම්කාරියගේ අත්සන.

දිනය:…………………………………...

**16.** අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................................ මහතා/ මහත්මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, .......................................................................... දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බව ද මෙයින් සහතික කරමි.

............................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

අත්සන සහතික කරන නිලධාරියාගේ
සම්පූර්ණ නම : ......................................................................................
තනතුර : ........................................................................................
ලිපිනය : ........................................................................................
දිනය : ........................................................................................

10 - 473

---

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ
ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ (PL1) විවෘත
බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2026

**1.0** **රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**2.0** **රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පහත වගුවෙන් දැක්වේ :-**

| *අනුමත තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| වැඩ සහායක | 10 |

**3.0** **වැටුප් පරිමාණය :-**

3.1. **වැටුප් කේත අංකය** - PL 1- 2025
3.2. **වැටුප් පරිමාණය** - රු. 40000 /- - 10 x 450-10 x 490 -10 x540-12 x590= රු. 61,880/-

*සටහන* - (I) රා.ප.ච 10/2025 හි උපලේඛන III අනුව 2027.01.01 දක්වා වැටුප් ගෙවන අතර, 2027.01.01 දින සිට උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදුකරනු ඇත.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

(II) මෙයට අමතරව රජයේ නිලධාරීන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමිවේ.

3.3 **වැටුප් ක්‍රමය :-**

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය (රු.)* |
|---|---|---|
| III | පියවර 01 | රු.40,000/- |
| II | පියවර 12 | රු. 44,990/- |
| I | පියවර 22 | රු. 49,940 /- |
| විශේෂ | පියවර 32 | රු. 55,390 /- |

**4.0** **තනතුරෙහි / තනතුරුවල ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

**5.0** **බඳවා ගැනීමේ ශ්‍රේණිය**: III ශ්‍රේණිය

**6.0** **භාෂා මාධ්‍යය** : සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යය

**7.0** **පැවරෙන කාර්යය භාරය:-**

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| වැඩ සහායක | සේවා ස්ථානය පවිත්‍ර කිරීම, ද්‍රව්‍ය ප්‍රවාහනයේදී උදව් කිරීම, කාර්මික මහතුන්ගේ නිෂ්පාදන හා සේවා කටයුතු වලදී අත්උදව් සැපයීම ඇතුළුව අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරීන් |

**8.0** මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් ය. පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට පත්වීම් බලධරයා හට බලය ඇත.

**9.0** **සුදුසුකම් :-**

**(I).** **අධ්‍යාපන සුදුසුකම් :**
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම.

**(II).** **වෘත්තීය සුදුසුකම් :** අදාළ නොවේ.

**(III).** **පළපුරුද්ද** : අදාළ නොවේ.

**(IV).** **කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**(V).** **වෙනත් :**
I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අංක 09 සිට 10 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් වන 2026.11.06 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**10.0** වයස :- අයදුම්පත් කැඳවන අවසන් දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතු ය.

**11.0** බඳවා ගැනීමේ ක්‍රමය :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගනු ලැබේ.

**11.1** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *ලකුණු ලබාදෙන ආකාරය* | *ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අ.පො.ස (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර එක් සමත් විෂයයකට ලකුණු 4 බැගින් | 12 |
| | | පිළිගත් ආයතනයක වසරකට නොඅඩු ඩිප්ලෝමා හෝ ඊට සමාන හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම | 08 |
| | | පිළිගත් ආයතනයක මාස 6 - වසර 1 අතර සහතික පත්‍ර පාඨමාලා සඳහා | 06 |
| | | පිළිගත් ආයතනයක මාස 3 - මාස 6 අතර සහතික පත්‍ර පාඨමාලා සඳහා | 04 |
| වෘත්තීය සුදුසුකම්/ පුහුණු පාඨමාලා | 25 | NVQ 2 මට්ටමේ සුදුසුකම් ලබා තිබීම | 05 |
| | | NVQ 3 මට්ටමේ සුදුසුකම් ලබා තිබීම | 08 |
| | | NVQ 4 මට්ටමේ හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම | 12 |
| සේවා පළපුරුද්ද | 30 | රජයේ හෝ පෞද්ගලික ආයතනයක වැද්දුම්, පෑස්සුම්, යන්ත්‍රන,වාත්තු, වඩු කාර්මාන්ත ආදී වූ යාන්ත්‍රික ඉංජිනේරුමය ක්ෂේත්‍රවල සේවා පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 05 බැගින් | 30 |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | 10 | ක්‍රීඩා සහතික සඳහා පළාත් මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 3 ක් ද, සමස්ථ ලංකා මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 5ක් ද (1 ක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහා) පාසලේ ශිෂ්‍ය නායක තනතුරු සඳහා ලකුණු 02 ක් හිමි වේ. | 10 |
| සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතාවය | 05 | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය අනුව ලකුණු ලබා දේ. | 05 |
| එකතුව | | | **100** |

*සටහන.* - තනතුරට ලබා ඇති පළපුරුද්ද පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**12.0** රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

**13.0** ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය රජයේ සේවයෙන් පහ කළ හැක.

**14.0** නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**15.0** අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

**16.0** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**17.0** අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් කළ යුතු ය :-

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
II. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය;
III. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**18.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**19.0** ඉල්ලුම් කළ යුතු පිළිවෙල :

සියලු විස්තර ඇතුළත් කරමින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද සනාථ කරන සහතිකවල පිටපත්ද සමග **2026.11.06** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොළොන්නාව පාර, කොළොන්නාව."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ **" ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III වන ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම - (2026) "** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

**ඉංජී.එස්.එන්.බී.එම්.පද්මසිරි,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 ඔක්තෝබර් මස 09 දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොළොන්නාව පාර,
කොළොන්නාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ**
**ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2026**

**Recruitment to the posts in the Primary Unskilled Service Category of the Department of Government Factory – 2026**

අයදුම්කරන භාෂා මාධ්‍යය:
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

| |
|---|
| |

( අදාළ අංකය කොටුව තුළ ලියන්න)

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**1.** (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.....................................................................................................................................................
.....................................................................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKA)

(ආ) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.....................................................................................................................................................
(උදා : H. M. S. RATHNAYAKA)

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්) :
.....................................................................................................................................................
.....................................................................................................................................................

**2.** (අ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :
.....................................................................................................................................................
.....................................................................................................................................................

(ආ) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
.....................................................................................................................................................
.....................................................................................................................................................

(ඇ) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන් /දෙමළෙන්):
.....................................................................................................................................................
.....................................................................................................................................................

**3.** ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

**4.** ස්ත්‍රී / පුරුෂ භාවය ස්ත්‍රී - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) පුරුෂ - 1 | |

**5.** උපන් දිනය : වර්ෂය : | | | | | මාසය: | | | දිනය: | | |

**6.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

**7.** දුරකථන අංකය : | | | | | | | | | | |

**8.** අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකපත්වල පිටපත් මේ සමග ඇමිණිය යුතුය)

8.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. පළමුවර ප්‍රතිඵල

විභාග අංකය : ................................................

: වර්ෂය ....................... මාසය .........................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II. දෙවන වර ප්‍රතිඵල
විභාග අංකය : ................................................
වර්ෂය ...................... මාසය .......................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර

I. විභාගයේ වර්ෂය හා මාසය : ................................................
II. විභාග අංකය : ................................................
ප්‍රතිඵල

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

**9.** අතිරේක අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකපත්වල පිටපත් මේ සමග ඇමිණිය යුතු ය.)

| *අනු. අංකය* | *ආයතනය* | *පාඨමාලාවේ නම* | *කාල සීමාව* | *සහතිකය වලංගු දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

**10.** වෘත්තීය සුදුසුකම් : (අදාළ සහතිකපත්වල පිටපත් මේ සමග ඇමිණිය යුතු ය.)

| අනු. අංකය | ආයතනය | පාඨමාලාවේ නම | NVQ මට්ටම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

**11.** තනතුරට අදාළව ලබා ඇති සේවා පළපුරුද්ද :

| අනු. අංකය | සේවා කාලය | | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**12.** විෂය බාහිර ක්‍රියාකාරකම් : .....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

**13.** දැනට කිසියම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

I. තනතුර හා ශ්‍රේණිය : ..........................................................................
II. පත් වූ දිනය : ..........................................................................
III. ආයතනය : ..........................................................................
IV. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් ද යන වග : ..........................................................................

**14.** ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවෙහි ✓ ලකුණ යොදන්න) ඔව් නම් විස්තරය සඳහන් කරන්න.

ඔව් ☐ නැත ☐

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**15.** අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඇ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතිකපත්වල පිටපත් අමුණා ඉදිරිපත් කරමි.

දිනය : .................................... .............................,
අයදුම්කරුගේ අත්සන

**16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : ( අදාළ නොවන වචන කපා හරින්න)**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................................ නැමැති මහතා/මහත්මිය/ මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, .................................දින ඔහු/ඇය මා ඉදිරිපිට අත්සන් කළ බවත් සහතික කරමි .

දිනය : ....................................... ......................................................
සහතික කරන්නාගේ අත්සන

සහතික කරන්නාගේ නම :...........................................................................................................
තනතුර :...........................................................................................................
ලිපිනය :...........................................................................................................
නිල මුද්‍රාව : ...........................................................................................................

***සටහන* -** අයදුම්පත සහතික කළ යුත්තේ *ගැසට්* නිවේදනයේ 15 ඡේදයේ සඳහන් පරිදි විය යුතු ය.

**17. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම්, ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...........................................................................................නැමැති මහතා/මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තු/සංස්ථාවේ / මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර, ඔහු /ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැක/ නොහැකි බවත් දන්වමි.

දිනය : ....................................... ......................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන

ආයතන ප්‍රධානියාගේ නම :...........................................................................................................
තනතුර :...........................................................................................................
ලිපිනය :...........................................................................................................
නිල මුද්‍රාව : ...........................................................................................................



SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

## රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

### රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ
### ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ (PL 2) විවෘත බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2026

**1.0** රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**2.0** රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පහත වගුවෙන් දැක්වේ.

| *අනු. අංකය* | *අනුමත තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | විදුලි දොඹකර ක්‍රියාකරු (Electric Crane Operator) | 01 |
| 02. | උඳුන්කරු සහායක (Furnanceman Assistant) | 01 |
| 03. | වැද්දුම්කරු (සාමාන්‍ය) සහායක ( Fitter (General) Assistant) | 05 |
| 04. | යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) සහායක (Machine Operator (Production) Assistant) | 01 |
| 05. | යන්ත්‍ර ක්‍රියාකරු සහායක ( Machinist Assistant) | 03 |
| 06. | වාත්තුකරු සහායක (Molder Assistant) | 04 |
| 07. | වාත්තුමල්කරු සහායක (Pattern Maker Assistant ) | 01 |
| 08. | ශීතකරණ හා වායු සමීකරණ කාර්මික සහායක (Refrigeration and Air Conditioning Technician Assistant) | 01 |
| 09. | ආයුධ හා අච්චු සාදන්නා සහායක (Tool and Die Maker Assistant ) | 01 |
| 10. | දැව කර්මාන්තකරු (ගොඩනැගිලි) සහායක ( Carpenter (Building) Assistant ) | 01 |
| 11. | දැව කර්මාන්තකරු (දැව භාණ්ඩ) සහායක (Carpenter (Furniture) Assistant) | 01 |
| 12. | පොරාදුකරු සහායක ( Hood Maker & Upholster Assistant ) | 01 |
| 13. | නළ කර්මාන්තකරු සහායක (Pipe Fitter Assistant) | 01 |
| | **එකතුව** | **22** |

**3.0 වැටුප් පරිමාණය :**

3.1. **වැටුප් කේත අංකය** - PL 2 - 2025

3.2. **වැටුප් පරිමාණය** - රු. 41,800 /- - 10 x 490-10 x 540 -10 x590-12 x 630 = රු. 65,560/-

*සටහන -* I) රා.ප.ච 10/2025 හි උපලේඛන III අනුව 2027.01.01 දක්වා වැටුප් ගෙවන අතර, 2027.01.01 දින සිට උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදුකරනු ඇත.

II) මෙම වැටුපට අමතරව පොදුවේ රජයේ නිලධාරීන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමිවේ.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

3.3 වැටුප් ක්‍රමය :

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය (රු.)* |
|---|---|---|
| III | පියවර 01 | රු. 41,800/- |
| II | පියවර 12 | රු. 47,240/- |
| I | පියවර 22 | රු. 52,690 /- |
| විශේෂ | පියවර 32 | රු. 58,630 /- |

**4.0 තනතුරෙහි / තනතුරු වල ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත
**5.0 බඳවා ගැනීමේ ශ්‍රේණිය** : III ශ්‍රේණිය
**6.0 භාෂා මාධ්‍යය** : සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය
**7.0 පැවරෙන කාර්යය භාරය:**

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| විදුලි දොඹකර ක්‍රියාකරු (Crane Operator) | යාන්ත්‍රික හා විදුලි දොඹකර ක්‍රියාකරවීම හා ඒවායේ සුළු නඩත්තු කටයුතු ඉටු කිරීම. |
| උදුන්කරු සහායක (Furnanceman Assistant) | සියලු වාත්තු ගැනීමේදී අවශ්‍ය වන උදුන් ක්‍රියාත්මක කරවීම හා උදුන් අලුත්වැඩියා කටයුතු වලදී සහය වීම. |
| වැද්දුම්කරු ( සාමාන්‍ය) සහායක (Fitter (General) Assistant) | සියලු බර වැද්දුම් කටයුතු කිරීම (විශාල පරිමාණ ගේට්ටු නිෂ්පාදනය) හා යන්ත්‍ර අලුත් වැඩියා කටයුතු වලදී සහය වීම. |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) සහායක (Machine Operator (Production) Assistant) | ඇණ සාදන යන්ත්‍ර, කියත් අලුත්වැඩියාවන් ආදී යන්ත්‍ර ක්‍රියාකරවීම සහ ඒවායේ සුළු නඩත්තු කටයුතු සඳහා සහය වීම. |
| යන්ත්‍රකරු සහායක (Machinist Assistant) | බෝරින්, මිලින්, ලේත් හා ඩ්‍රිලින් යන්ත්‍ර ක්‍රියාකරවීම හා එමගින් ලෝහ කොටස් අවශ්‍ය පරිදි යන්ත්‍රණය කිරීම හා ඒවායේ සුළු සේවාවන් වලදී සහාය වීම |
| වාත්තුකරු සහායක (Molder Assistant) | වාත්තු ගැනීමට අවශ්‍ය වන වාත්තු අච්චු සෑදීම, වාත්තුව සඳහා ඒවා සූදානම් කිරීම හා වාත්තු ගැනීමේ කටයුතු වලදී සහය වීම. |
| වාත්තුමල්කරු සහායක (Pattern Maker Assistant ) | වාත්තු අච්චු සෑදීම සඳහා අවශ්‍ය වන වාත්තුමල් ලී වලින් සෑදීම සඳහා සහය වීම. |
| ශීතකරණ සහ වායු සමිකරණ කාර්මික සහායක (Refrigeration and Air Conditioning Technician Assistant) | සියලුම වර්ගයේ වායු සමීකරණ සේවා කිරීම හා අලුත් වැඩියා කිරීම් කටයුතු වලදී සහය වීම. |
| ආයුධ සහ අච්චු සාදන්නා සහායක (Tool and Die Maker Assistant) | ආයුධ හා විවිධ හැඩ ඇති යකඩ කොටස් සෑදීම සඳහා අවශ්‍ය අච්චු නිපදවීම හා ඒවායේ අළුත් වැඩියා කටයුතු කිරීමේදී සහය වීම. |
| දැව කර්මාන්තකරු (ගොඩනැගිලි) සහායක (Carpenter (Building) Assistant ) | ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වන සියලු දැව කටයුතු සකස් කිරීම. (වහලවල්, උළුවහු හා ජනෙල් ආදිය) හා ඒවායේ සිදුවන අලුත්වැඩියා කටයුතු වලදී සහය වීම. |
| දැව කර්මාන්තකරු (දැව භාණ්ඩ) සහායක (Carpenter (Furniture) Assistant) | ලී වලින් නිෂ්පාදනය කරන සියලුම වර්ගයේ ගෘහ භාණ්ඩ සෑදීම, ඒවා පොලිෂ් කිරීම හා ඉහත භාණ්ඩවල සිදු කරන අලුත් වැඩියාවන් වලදී සහය වීම. |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| පොරාදුකරු සහායක ( Hood Maker & Upholster Assistant) | සියලු කුෂන් වැඩ කිරීම, තිර රෙදී මසා සවිකිරීම, උත්සව වලදී කාපට් හා රැලි පාලම් ආදිය දැමීම ආදී කටයුතු වලදී සහය වීම. |
| නළ කර්මාන්තකරු සහායක (Pipe Fitter Assistant) | වායු සම්පීඩන යන්ත්‍ර, බොයිලේරු ක්‍රියාකරවීමේදී හා සුළු නඩත්තු කටයුතු වලදී සහය වීම. |

**8.0 සුදුසුකම් :**

**I). අධ්‍යාපන සුදුසුකම් :**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම

*සටහන :-*

I). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2016ට අනුව NVQ 03 වන මට්ටමේ නිපුණතාවයක් ලබා ඇත්නම් අංක I යටතේ සඳහන් කර ඇති අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවේ.

**II). වෘත්තීය සුදුසුකම් :**

I. එක් එක් තනතුරෙහි කාර්යය භාරයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා දෙවන මට්ටමට ( NVQ 02) නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වෘත්තීය සුදුසුකම් :**

| *අනුමත තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| විදුලි දොඹකර ක්‍රියාකරු(Crane Operator) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>*හෝ*<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ විදුලි දොඹකර ක්‍රියාකරවීම සම්බන්ධව අවම වශයෙන් වර්ෂ 02ක පළපුරුද්දක් ලබා තිබීම. |
| උඳුන්කරු සහායක (Furnanceman Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>*හෝ*<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ පිළිගත් ආයතනයක වර්ෂ 02ක පළපුරුද්දක් ලබා තිබීම. |
| වැද්දුම්කරු ( සාමාන්‍ය ) සහායක( Fitter (General) Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>*හෝ*<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ යන්ත්‍ර උපකරණ සහ ඩයි වර්ග කොටස් එකලස් කිරීම සහ සවි කිරීම පිළිබඳව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම. |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) සහායක (Machine Operator (Production) Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>*හෝ*<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු යන්ත්‍ර ක්‍රියාකරු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම. |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| අනුමත තනතුරු නාමය | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| යන්ත්‍රකරු සහායක ( Machinist Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු යන්ත්‍රකරු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ යන්ත්‍රණය පිළිබඳව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම. |
| වාත්තුකරු සහායක (Molder Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු වාත්තු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ වාත්තුකරුවෙකු වශයෙන් පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම. |
| වාත්තුමල්කරු සහායක (Pattern Maker Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු වාත්තුමල් පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ වාත්තුමල් සෑදීම සම්බන්ධ අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම. |
| ශීතකරණ සහ වායු සමීකරණ කාර්මික සහායක (Refrigeration and Air Conditioning Technician Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු වායු සමීකරණ පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ අවම වශයෙන් ශීතකරණ සහ අධිශීතකරණ සහ වායු සමීකරණ සවි කිරීම සහ අලුත්වැඩියාව සම්බන්ධයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |
| ආයුධ සහ අච්චු සාදන්නා සහායක (Tool and Die Maker Assistant ) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු ආයුධ සහ අච්චු නිෂ්පාදන පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ ආයුධ සහ අච්චු සෑදීම සම්බන්ධව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම. |
| දැව කර්මාන්තකරු (ගොඩනැගිලි) සහායක (Carpenter (Building) Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු ගොඩනැගිලි වහල සෑදීම් පිළිබඳව පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ දැව කර්මාන්තය ගොඩනැගිලි සම්බන්ධව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |
| දැව කර්මාන්තකරු (දැව භාණ්ඩ) සහායක (Carpenter (Furniture) Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු දැව භාණ්ඩ සෑදීමේ පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ දැව භාණ්ඩ සෑදීම සම්බන්ධව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම. |
| පොරාදුකරු සහායක (Hood Maker & Upholster Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ පිළිගත් ආයතනයක වර්ෂ 02ක පළපුරුද්දක් පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතු ය. |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනුමත තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| නළ කර්මාන්තකරු සහායක(Pipe Fitter Assistant) | I. NVQ දෙවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම;<br>*හෝ*<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ බොයිලේරු හා වායු සම්පීඩක කර්මාන්තය සම්බන්ධව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබිම. |

**III). පළපුරුද්ද :** අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ.

**IV). කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**V). වෙනත් :**

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය;
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් වන 2026.11.06 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**9.0 වයස :-** අයදුම්පත් කැඳවන අවසන් දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතු ය.

**10.0** බඳවා ගැනීමේ ක්‍රමය :- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා තනතුරට අදාළ දැනුම පරීක්ෂා කරන ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**10.1 යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය**

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *ලකුණු ලබා දෙන ක්‍රමය* | *ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | • අ.පො.ස (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර එක් විෂයකට ලකුණු 3 බැගින් | ලකුණු 09 |
| | | • පිළිගත් ආයතනයක වසරකට නොඅඩු ඩිප්ලෝමා හෝ ඊට සමාන හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම. | ලකුණු 04 |
| | | • පිළිගත් ආයතනයක මාස 06 කට නොඅඩු හෝ සම්මත පැය ගණන සම්පූර්ණ කළ සහතික පත්‍ර පාඨමාලා සඳහා | ලකුණු 02 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 | සුදුසුකම් ඉල්ලුම් කරනු ලබන ක්ෂේත්‍රයේ NVQ 3 හෝ ඊට වැඩි සුදුසුකම් සඳහා ලකුණු 25ක් හිමි වේ. | ලකුණු 25 |
| | | වෙනත් ක්ෂේත්‍රයක NVQ 3 හෝ ඊට වැඩි සුදුසුකම් සඳහා ලකුණු 10ක් හිමි වේ. | ලකුණු 10 |
| අතිරේක පළපුරුද්ද | 45 | රජයේ / පෞද්ගලික ලියාපදිංචි ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද එක් වසරකට ලකුණු 05 ක් හිමි වේ. | ලකුණු 45 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී පිළිබිඹු කරන කුසලතා නායකත්වය, ආකල්ප, පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතාවය සඳහා ලබාදෙන ලකුණු | 05 | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය අනුව ලකුණු ලබා දේ. | ලකුණු 05 |
| **එකතුව** | **100** | | |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**10.2. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණය :**

| *තනතුරු නාමය* | *විෂය ක්ෂේත්‍රය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|---|
| විදුලි දොඹකර ක්‍රියාකරු | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>• දොඹකරය ක්‍රියා කරවීම සඳහා සූදානම් කරවීම.<br>• බර උසුලන යන්ත්‍රන මගින් බරක් නිසි පරිදි සම්බන්ධ කර මෙහෙයවීම.<br>• බරක් නිසි පරිදි හැසිරවීම.<br>• සුළු සීරුමාරුව සහ සුළු අලුත්වැඩියා කිරීම | පැය 03 | **100** | **40** |
| උඳුන්කරු සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>• දෙන ලද පිරිවිතරයකට අනුව උඳුන/ කියුපෝලාව ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා ලෝහවල නියමිත බර හඳුනා ගෙන කිරා උඳුන/ කියුපෝලාව නිසි පරිදි ක්‍රියාකරවීම.<br>• ෆර්නසය ක්‍රියාකරවීම ආරම්භ කර අවශ්‍ය ලෝහ කොටස් උනුකර අප ද්‍රව්‍ය ඉවත් කර ද්‍රවණය වූ ලෝහය ලබා ගෙන ෆර්නසය භාර අධීක්ෂණ නිලධාරියා විසින් ලබා දෙන උපදෙස් පරිදි එය නවතා දැමීමට හැකි විය යුතු යි.<br>• කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්ස්, බර්නර්ස්, ඔසවන සහ අමුද්‍රව්‍ය ඇතුළත් කරන උපකරණ, සහ බර කිරන සියලුම යන්ත්‍ර ක්‍රියාකර හැකි විය යුතු යි.<br>• උඳුන/ කියුපෝලාව / ලේඩලය නැවත වාත්තු ගැනීම සඳහා සකස් කිරීම සහ අලුත්වැඩියා කිරීම සහ ලිප වැසීම සඳහා අවශ්‍ය වන ෆයර් ක්ලේ ප්ලග් සැකසීම. | පැය 03 | **100** | **40** |
| වැද්දුම්කරු (සාමාන්‍ය) සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>• යන්ත්‍ර උපකරණ සහ අච්චුවල කොටස් ගැලවීම, එකලස් කිරීම සහ සවි කිරිම.<br>• යන්ත්‍රෝපකරණ / ඩයි/ අච්චුවල දෙන ලද කොටසක් අලුත් වැඩියා කිරීම. | පැය 03 | **100** | **40** |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>• කම්මල් හැඩ තලන යන්ත්‍ර සහ පීඩක ක්‍රියාකරවිම සහ දෛනික නඩත්තු කළ හැකි විය යුතු යි<br>• බෝල්ට් ඇණ හැඩ තලන යන්ත්‍ර ක්‍රියාකරවීම සහ නඩත්තු කිරීම කළ හැකි විය යුතු යි.<br>• ද්‍රව පීඩක යන්ත්‍ර ක්‍රියාකරවීම සහ දෛනික නඩත්තු කළ හැකි විය යුතු යි. | පැය 03 | **100** | **40** |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| *තනතුරු නාමය* | *විෂය ක්ෂේත්‍රය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|---|
| යන්ත්‍රකරු සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි<br>• ලේත් යන්ත්‍ර කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතු ය.<br>• ඩ්‍රිලින් සහ ඒ අශ්‍රිත කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතු ය.<br>• ලේත් සහ ඩ්‍රිලින් ටූල්ස් ග්‍රයින්ඩින් කිරිම පිළිබඳ පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. | පැය 03 | 100 | 40 |
| වාත්තුකරු සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>• අමු පස් හෝ වියළි අරු පස් යොදාගෙන කොටස් දෙකක හෝ තුනක මධ්‍යම ප්‍රමාණයේ වාත්තු ආච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් වාත්තුවක් සඳහා පිළියෙල කළ යුතු යි.<br>• සාදන ලද අච්චුව වාත්තු පරීක්ෂණයකට සතුටුදායක ලෙස භාජනය කළ හැකි විය යුතු යි.<br>• ෆෙරස් සහ නිෆෙරස් වැඩ සඳහා භාවිතාවට ගන්නා අමුපස් සහ වියලි අරු පස් සම්මත අනුපාතයන් සහ පස් මිශ්‍රණයන් ගැන දැනගත යුතු වන අතර ඒවා සැදීමට හැකිවිය යුතු යි.<br>• සරල කොටස් දෙකක වාත්තු අච්චු තැලීම, වා තච් ලෑම, සහ එකලස් කිරීම අතින් හෝ යන්ත්‍ර භාවිතයෙන් කළ හැකිවිය යුතු යි. | පැය 03 | 100 | 40 |
| වාත්තුමල්කරු සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>• කෝර ප්‍රින්ට් භාවිතා කිරීමට අදාළව දෙන ලද සැලසුමකට අනුව වාත්තු මලක් සෑදීම<br>• 2 1/2”x1/2 “ ටී මෝර්ටිස සහ ටෙන්ට් ජොයින්ට් පරීක්ෂණ කාලය තුළ නිම කිරීම | පැය 03 | 100 | 40 |
| ශීතකරණ සහ වායු සමීකරණ කාර්මික සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>• ශීතකරණ සහ වායු සමීකරණ පද්ධතියක් සවිකිරීම පිළිබඳ ඇස්තමේන්තු සැකසීම.<br>• වින්ඩෝස් සහ ස්ප්ලිට් වර්ගයේ වායු සමීකරණ සවිකිරීම.<br>• ශිතකරණ සහ ජල ශීතකරණ, සුදර්ශන ඒකක ශීතකරණ, බෝතල් ශීතකරණ, අධි ශීතකරණ අලුත්වැඩියා කිරිම.<br>• වින්ඩොස් සහ ස්ප්ලිට් වර්ගයේ වායුසමීකරණ අලුත්වැඩියා කිරීම. | පැය 03 | 100 | 40 |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| තනතුරු නාමය | විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| ආයුධ සහ අච්චු සාදන්නා සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි<br>• CNC Milling යන්ත්‍රය ක්‍රියාකරවීමේ හැකියාව.<br>• ආයුධ හා අච්චු සෑදීම සඳහා අවශ්‍ය වන ලෝහ වර්ග හඳුනා ගැනීම.<br>• පොලිෂින් කළ හැකි විය යුතුයි.<br>• ආයුධ සහ ඩයි සෑදිය හැකි විය යුතුයි. | පැය 03 | **100** | **40** |
| දැව කර්මාන්තකරු (ගොඩනැගිලි) සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි<br>• සැලසුමට අනුව වහල සැකසීම සඳහා දැව හඳුනා ගැනීමට හැකි වීම.<br>• පඩිපෙල ඉදිකිරීම් වැඩ කිරීම.<br>• බිම් සැකසීම සහ ජනේල සකස් කිරීමේ වැඩ | පැය 03 | **100** | **40** |
| දැව කර්මාන්තකරු ( දැව භාණ්ඩ) සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි<br>• දැව භාණ්ඩ සෑදීමට ඇස්තමේන්තු ලබාදිය හැකි විය යුතු යි.<br>• දැව වෙනුවට භාවිතා කරන කෘතිම අමුද්‍රව්‍ය යොදා දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි.<br>• යන්ත්‍රණය කර නිමා කරන ලද දැවවලින් සහ දැව බෝර්ඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි.<br>• අදාළ සියලුම යන්ත්‍රෝපකරණ නඩත්තුව සහ ආයුධ උපකරණ මුවහත් කිරීම සහ පවර් ටූල් නඩත්තුව කළ හැකිවිය යුතු යි. | පැය 03 | **100** | **40** |
| පොරාදුකරු සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>• මහන මැෂිම ක්‍රියා කරවීම සහ අතින් මැසිය හැකි විය යුතු යි.<br>• වාහනයක ආසනය කුෂන් කිරීම සඳහා මාර්ක් කර කපා සකස් කිරීම සහ පැති ජනේල සඳහා ආවරණ සැකසීම.<br>• වාහනයක හුඩ් (වහලය) සඳහා සහ පැති සඳහා ජනෙල් කැන්වස් යොදා සැකසීම හෝ දෙන ලද පැච් වැඩක් කිරීම. | පැය 03 | **100** | **40** |
| නළ කර්මාන්තකරු සහායක | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>• උණුසුම් සහ සීතල ජල සැපයුම් නළ සවි කිරීම සහ නඩත්තුව<br>• මල අපද්‍රව්‍ය පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>• ගෑස්සපයන නළ පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>• පොම්ප සවි කිරීම සහ නඩත්තුව<br>• අධි පීඩන නළ සවි කිරීම් හා නඩත්තු | පැය 03 | **100** | **40** |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

*සටහන -* තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දින වන 2026.11.06 දිනට වලංගු විය යුතු ය.

**11.0** රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

**12.0** ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. (අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය රජයේ සේවයෙන් පහ කළ හැක.)

**13.0** නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. නිවේදනයේ ඇතුලත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**14.0** අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

**15.0** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත්කර ඇති සියලු අයදුම්කරුවන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් වෘත්තීය ප්‍රායෝගික හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**16.0** අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
II. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය;
III. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**17.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**18.0** ඉල්ලුම් කළ යුතු පිළිවෙල :-

සියලු විස්තර ඇතුලත් කරමින් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද සනාථ කරන සහතිකවල පිටපත්ද සමග **2026** නොවැම්බර් මස **06** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොළොන්නාව පාර, කොළොන්නාව."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **" ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ III වන ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම - (2026) "** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

**ඉංජි. එස්.එන්.බී.එම්. පද්මසිරි,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 ඔක්තෝබර් මස 09 දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොළොන්නාව පාර,
කොළොන්නාව.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ
ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2026

**Recruitment to the posts in the Primary Semi Skilled Service Category of the Department of Government Factory – 2026**

අයදුම්කරන භාෂා මාධ්‍යය:

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

( අදාළ අංකය කොටුව තුළ ලියන්න)

තනතුරට අදාළ අනු අංකය

ඉල්ලුම් කරන තනතුර :- ..........................................................................................................

(එක් තනතුරකට එක් අයදුම්පත බැගින් ඉදිරිපත් කළ යුතු ය.)

**1.** (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..........................................................................................................
..........................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKA)

(ආ) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..........................................................................................................
(උදා : H. M. S. RATHNAYAKA)

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්) :
..........................................................................................................
..........................................................................................................

**2.** (අ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :
..........................................................................................................
..........................................................................................................

(ආ) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
..........................................................................................................
..........................................................................................................

(ඇ) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන් /දෙමළෙන්):
..........................................................................................................
..........................................................................................................

**3.** ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**4.** ස්ත්‍රී / පුරුෂ භාවය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරුෂ - 1
ස්ත්‍රී - 0

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

**5.** උපන් දිනය : වර්ෂය : | | | | | මාසය: | | | දිනය: | | |

**6.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

**7.** දුරකථන අංකය : | | | | | | | | | | |

**8.** අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකපත්වල පිටපත් මේ සමග ඇමිණිය යුතුය)

8.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. පළමුවර ප්‍රතිඵල :
විභාග අංකය : ................................................
: වර්ෂය ....................... මාසය .........................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II. දෙවන වර ප්‍රතිඵල :
විභාග අංකය : ................................................
වර්ෂය ....................... මාසය ........................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(I.) විභාගයේ වර්ෂය හා මාසය : ................................................
(II.) විභාග අංකය : ................................................

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

**9.** අතිරේක අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකපත්වල පිටපත් මේ සමග ඇමිණිය යුතු ය.)

| අනු. අංකය | ආයතනය | පාඨමාලාවේ නම | කාලසීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**10.** වෘත්තීය සුදුසුකම් : (අදාළ සහතිකපත්වල පිටපත් මේ සමග ඇමිණිය යුතු ය.)

| අනු. අංකය | ආයතනය | පාඨමාලාවේ නම | NVQ මට්ටම | කාලසීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

**11.** තනතුරට අදාළව ලබා ඇති සේවා පළපුරුද්ද :

| අනු. අංකය | සේවා කාලය | | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**12.** විෂය බාහිර ක්‍රියාකාරකම් : ..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**13.** දැනට ආයතනයක කිසියම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

I. තනතුර හා ශ්‍රේණිය : ..........................................................................................
II. පත් වූ දිනය : ..........................................................................................
III. ආයතනය : ..........................................................................................
IV. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් ද යන වග : ..........................................................................................

**14.** ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවෙහි ✓ ලකුණ යොදන්න) ඔව් නම් විස්තරය සඳහන් කරන්න.

ඔව් ☐ නැත ☐

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

**15.** අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතිකපත්වල පිටපත් අමුණා ඉදිරිපත් කරමි.

දිනය : ..................................

............................,
අයදුම්කරුගේ අත්සන.

**16.** **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න)**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................................ නමැති මහතා/මහත්මිය/ මෙනෙවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, .................................දින ඔහු/ඇය මා ඉදිරිපිට අත්සන් කළ බවත් සහතික කරමි .

දිනය : .......................................

.....................................................,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ නම :........................................................................................................
තනතුර :........................................................................................................
ලිපිනය :........................................................................................................
නිල මුද්‍රාව : ........................................................................................................

***සටහන.-*** අයදුම්පත සහතික කළ යුත්තේ *ගැසට්* නිවේදනයේ 15 ඡේදයේ සඳහන් පරිදි විය යුතු ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**17.** **රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම්, ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................නමැති මහතා/මහත්මිය/ මෙනවිය, මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තු/සංස්ථාවේ / මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර, ඔහු /ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැක/ නොහැකි බවත් දන්වමි.

දිනය : ......................................

....................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතන ප්‍රධානියාගේ නම :..................................................................................................................
තනතුර :..................................................................................................................
සේවා ස්ථානයේ ලිපිනය :..................................................................................................................
නිල මුද්‍රාව : ..................................................................................................................

10 - 489

---

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාව**

විශේෂ දැනුම්දීම යි

ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ (කෙටි හා දීර්ඝ කාලීන අධිකාරිය) ඉඳුරාම නිලධාරින්/ නිලධාරිනියන් සහ ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ ඉඳුරාම නිලධාරින්/ නිලධාරිනියන්ගේ පුරප්පාඩු සම්බන්ධව 2026 සැප්තැම්බර් මස 11 වන සිකුරාදා දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2506 *ගැසට් පත්‍රයේ* I කොටසෙහි (IIඅ) ඡෙදයේ පිටු අංක 38 සිට 51 දක්වා තනතුරු ඇබෑර්තු සඳහා පළකර ඇති *ගැසට්* නිවේදනයේ ඉල්ලුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026 නොවැම්බර් මස 01 වන දින දක්වා දීර්ඝ කෙරේ.

**කේ. ඩී. ඩී. සී. ප්‍රනාන්දු,**
ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, ආර්සීඩීඑස්,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

10 - 517

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**හෝමියෝපති වෛද්‍ය සභාව**

ඖෂධ සංයෝජක බඳවා ගැනීම් සඳහා වන NVQ පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි ඖෂධ සංයෝජක තනතුර සඳහා අවශ්‍ය ජාතික වෘත්තීය කුසලතා (NVQ) පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

**මූලික සුදුසුකම් :-**

- *අධ්‍යාපන සුදුසුකම් :* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට අවම වශයෙන් විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.
- *වයස් සීමාව :* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**වෙනත් සුදුසුකම් :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**පාඨමාලා ගාස්තුව :**

- රු. 25,000

  මුදල් ගෙවීමේ සහ අයදුම්පත් යොමු කිරීමේ උපදෙස් :

  පාඨමාලා ගාස්තුව වන රු. 25,000/- පහත සඳහන් බැංකු ගිණුමට තැන්පත් කර, ලබාගන්නා ලදුපතෙහි මුල් පිටපත (හේතුව සඳහන් කර), පහත සඳහන් ආකෘතිය අනුව ඔබ විසින් සකසා සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අමුණා, පහත සඳහන් ලිපිනයට 2026 ඔක්තෝබර් මස 31 දිනට පෙර හෝමියෝපති වෛද්‍ය සභාව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

- **ගිණුම් නාමය :** Homoeopathic Fund
- **ගිණුම් අංකය :** 0002026466
- **බැංකුව සහ ශාඛාව :** ලංකා බැංකුව (BOC), තැප්‍රොබේන් ශාඛාව
- **ලිපිනය :** ලේඛකාධිකාරී, හෝමියෝපති වෛද්‍ය සභාව, අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම.

**රෙජිස්ට්‍රාර්,**
හෝමියෝපති වෛද්‍ය සභාව.

අංක 94,
වැලිසර,
රාගම.

**අයදුම්පත් ආකෘතිය**

හෝමියෝපති වෛද්‍ය සභාව

**ඖෂධ සංයෝජක (NVQ) පාඨමාලාව සඳහා අයදුම්පත - 2026**

1. සම්පූර්ණ නම (සිංහලෙන්) : ....................................................................................................
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....................................................................................................

2. ස්ථිර ලිපිනය : ....................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................................................

4. දුරකථන අංකය : ....................................................................................................

5. උපන් දිනය : ....................................................................................................
   2026.10.31 දිනට වයස : අවුරුදු : ........................ මාස: ........................ දින : ........................

6. දිස්ත්‍රික්කය : ....................................................................................................

7. අධ්‍යාපනික සුදුසුකම් (අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල) :

   විභාග වර්ෂය : ................................ විභාග අංකය : ................................

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | ........................... | .................. |
| 2. | ........................... | .................. |
| 3. | ........................... | .................. |
| 4. | ........................... | .................. |
| 5. | ........................... | .................. |
| 6. | ........................... | .................. |
| 7. | ........................... | .................. |
| 8. | ........................... | .................. |
| 9. | ........................... | .................. |

8. ගෙවන ලද පාඨමාලා ගාස්තුවේ විස්තර :
*මුදල : රු. 25,000
*මුදල් තැන්පත් කළ දිනය : ..................
*බැංකු ශාඛාව : ..................
(ලදුපත අයදුම්පත සමග අනිවාර්යයෙන්ම අමුණන්න)

අයදුම්කරුගේ ප්‍රකාශය :

.........................................................................................................................................................
මා විසින් ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, පාඨමාලාවට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවටත් මෙයින් ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් අසත්‍ය බවට අනාවරණය වුවහොත් පාඨමාලාවෙන් මා ඉවත් කිරීමට කටයුතු කරන බවට එකඟ වෙමි.

.................................... ....................................,
දිනය අයදුම්කරුගේ අත්සන

10 - 443

---

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

### සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ:-

02. පහත දක්වනු ලබන ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම් පත්‍ර 2026.10.30 වැනි දින හෝ ඊට පෙර "සුරාබදු කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සුරාබදු නියාමක රියදුරු තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

*විභාග ගාස්තුව රු.600 කි. එම ගාස්තුව සුරාබදු කොමසාරිස් ජනරාල් නමින් ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ විවෘත කර ඇති 7041628 ගිණුම් අංකයට බැර කර එහි ලදුපතෙහි මුල් පිටපත ඔබගේ අයදුම්පතෙහි නියමිත ස්ථානයෙහි අලවන්න.

**03.** **මාසික වැටුප් ක්‍රමය :** රුපියල් 49,550-7x540-27x670-71,420/- ක් වේ. රු. 49,550 ක් වූ මාසික වැටුප මත පිහිටවනු ලැබේ. (රා.ප.ච. 10/2025 ට අනුව RS 01-2025 (PC) උක්ත වැටුප් ක්‍රමයේ 50,630 වැටුප් තලය ඉක්මවා යාමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**04.** **වයස් සීමාව:-** ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

05. තනතුරට බඳවා ගැනීමට අදාළ සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී තිබිය යුතු ය.

**(i)** **අධ්‍යාපන සුදුසුකම් :-**
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී එක් වරකදී විෂයන් 05 කට නොඅඩුව සමත්ව, දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල / දෙමළ භාෂාව හා වෙනත් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ගණිතය ඇතුළුව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

**(ii)** **වෘත්තීය සුදුසුකම් :-**

a. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් ලබා තිබීම.
b. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික දැනුමක් ලබා තිබීම.
c. මෝටර් බස් රථ, මෝටර් කෝච්, “A”පන්තිය පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**(iii)** **සේවා පළපුරුද්ද :-**

අදාළ බණ්ඩයේ රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් අනතුරුව වසර 03 ක මෝටර් වාහන රියදුරෙකු වශයෙන් පිළිගත් ආයතනයක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**(iv)** **කායික සුදුසුකම් :-**

a. උස අවම වශයෙන් 5' 4" විය යුතු ය.
b. ප්‍රාශ්වාසයේ දී පපුව අවම වශයෙන් 32 (අඟල්) විය යුතු ය.
c. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්නාඩි රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 ඇස් පෙනීමකින් යුක්ත විය යුතු ය.
d. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**(v)** **වෙනත් සුදුසුකම් :-**

අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

**06.** **බඳවා ගන්නා ක්‍රමය:**

**(i)** රජයේ *ගැසට් පත්‍රයේ* දැන්වීමක් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය කෙරේ. මෙම ලිඛිත පරීක්ෂණ සිංහල හා දෙමළ භාෂාවලින් පැවැත්වෙන අතර මහා මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව සාමාන්‍ය දැනුම මැන බැලීම සඳහා පවත්වනු ඇත. ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීම සඳහා ඉඩ දෙනු නොලැබේ.

(ii) එම ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සේ කායික යෝග්‍යතා පරීක්ෂණයට හා රිය පැදවීමේ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයකට භාජනය කොට, ඉන් සමත් වූ අය ඔවුන් එම පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු හා ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගත් ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව සුරාබදු නියාමක රියදුරු තනතුරට පත් කිරීම සඳහා තෝරා ගනු ඇත.

**(iii)** **ලිඛිත විභාගය :**

| *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| (i.) මහා මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | පැය 03 | 100 | 40% |
| (ii.) පොදු ප්‍රශ්න පත්‍රය | පැය 01 වි.30 | 100 | 40% |

**විභාගය සඳහා වන විෂය නිර්දේශය:**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| **1.** මහා මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | මහා මාර්ග නීති පිළිබඳව දැනුම කාර්මික ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුම සහ එම ක්ෂේත්‍රයන්ට අදාල දෝෂයන් පිළිබඳව මූලික අවබෝධය මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| **ii.** පොදු ප්‍රශ්න පත්‍රය | අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම මැන බැලීම සඳහා සකස්වන පොදු ප්‍රශ්න පත්‍රයකි. |

**පවත්වන බලධරයා : පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්**

**(iv) වෘත්තීය පරීක්ෂණය : රිය පැදවීමේ නිපුනත්වය මැනීමේ ප්‍රායෝගික පරීක්ෂණයකි.**

| | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| රිය පැදවීමේ නිපුනතාවය | **40** | **40%** |

**පවත්වන බලධරයා:** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ - මෝටර් රථ පරීක්ෂකවරයකු, පොලිස් සේවයේ නිලධාරියකු හා දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගෙන් සමන්විත මණ්ඩලයක අධීක්ෂණය යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ මෙහෙය වීම යටතේ මෙම වෘත්තීය පරීක්ෂණය පවත්වනු ඇත.

**v) කායික යෝග්‍යතා පරීක්ෂණය :** බඳවා ගැනීමේ පටිපාටියේ 7.2.2.4 වගන්තිය අනුව අදාල සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා

**(vi) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:**

**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු:**
සුරාබදු නියාමක රියදුරු තනතුරට සෑම අතින්ම යෝග්‍ය පුද්ගලයකු ද, යන්න පරීක්ෂා කිරීම අවශ්‍ය මූලික සුදුසුකම් තිබේද යන්න පරීක්ෂා කර බැලීම (සහතික පත් පරීක්ෂාව)

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : සුරාබදු කොමසාරිස් ජනරාල්

07. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය. මෙම තනතුර සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝග යටතේ පාලනය වන නිල ඇඳුම් (යුනිෆෝම්) අඳින තනතුරකි.

08. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක : 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

09. මෙම පත්වීමට අදාළ බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසා ඒ පිළිබඳව තීරණය කරනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන ඉල්ලුම්කරුවන්ට ඒ බැව් ලිඛිතව දන්වනු ලැබේ. මේ සඳහා ගමන් වියදම් ආදිය ගෙවනු නොලැබේ.

**එම්. බී. එන්. ඒ. ජේමරත්න,**
සුරාබදු කොමසාරිස් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 30 වැනි දින,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ දී ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026***

විභාගයට පෙනී සිටින මාධ්‍යය :
සිංහල - 1 ☐
දෙමළ - 2

1. (i) සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්): ..........................................................................................................

(ii) සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........................................................................................................

(iii) මුලකුරු සමග නම: ..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........................................................................................................

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ..........................................................................................................

(vi) තැපැල් ලිපිනය: ..........................................................................................................
(විභාග ප්‍රවේශ පත්‍ර එවීම සඳහා)

3. ස්ත්‍රී / පුරුෂභාවය :-

පුරුෂ - 0 ☐
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

5. ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6. උපන් දිනය :
2026.10.30 ........... දිනට වයස : අවුරුදු : ........... මාස : ............... දින: .....................

7. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන බව :........................
(පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග සඳහන් කරන්න)

8. ජාතිය : ................................

9. විවාහක ද/ අවිවාහක ද යන වග:..........................

10. සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර :
..........................................................................................................
..........................................................................................................

11. විභාග නිවේදනයේ අංක 1 යටතේ සුදුසුකම් සපුරන දිනය : ............................................................

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

12. විභාග ගාස්තු පිළිබඳ විස්තර:
   I. විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව : ............
   II. ලදුපත් අංකය හා දිනය : ..................................
   III. ගෙවූ මුදල : ...................................................

| ලදුපත මෙහි අලවන්න (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |
| --- |

13. අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමටත් හැකි බව මම දනිමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද, ප්‍රකාශ කරමි. අදාළ විභාග ගාස්තුව ගෙවූ බවද ප්‍රකාශ කරමි.

දිනය : …………………………. ……………………………,
අයදුම්කරුගේ අත්සන.

10 - 445

---

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/කාන්තා) - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත ලිඛිත තරග විභාගය - 2026

උක්ත කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2504 හා 2026.08.28 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමෙහි,

- 3.4 ඡේදය පහත පරිදි සංශෝධනය කරමි.

"රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂා පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු වේ."

- 05 (ඇ) ඡේදය පහත පරිදි සංශෝධනය කරමි.

**"2026.09.28 දිනට අවම වයස් සීමාව අවුරුදු 18 නොඅඩු විය යුතු අතර උපරිම වයස් සීමාව අවුරුදු 28 නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2008.09.28 දිනට හෝ ඊට පෙර හා 1998.09.28 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)"**

මේ අනුව අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2026.10.16 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

මේ වන විටත් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

තව ද, එම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින බව ද, වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**රවීන්ද්‍ර පත්මප්‍රිය,**
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2026 ඔක්තෝබර් මස 06 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

10 - 521

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

### සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

### අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී (හෙද) උපාධිධාරීන් බඳවා ගැනීම - 2026 වර්ෂය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා 2025 සැප්තැම්බර් මස 30 දින නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 ට අනුව පහත 02 ඡේදයේ සඳහන් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් විද්‍යාවේදී (හෙද) උපාධිය (B.Sc. (Nursing) Degree) ලබා ඇති පහත සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අයදුම්කරුවන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන, පවතින පුරප්පාඩු අනුව වාර්ෂිකව පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් 25% ක් විද්‍යාවේදී හෙද උපාධිය මත අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් තෝරා ගනු ලැබේ. ඒ අනුව හෙද අනුස්ථාපන හා පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් 1000 දෙනෙකු තෝරා ගැනීමට නියමිත ය.

2. *තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් -*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද විද්‍යාවේදී (හෙද) උපාධියක්;

*හෝ*

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද විද්‍යාවේදී (හෙද) උපාධියක්;

*හෝ*

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් විද්‍යාවේදී (හෙද) උපාධියක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. කායික සුදුසුකම් හා වෙනත් සුදුසුකම් -

(*අ*) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

(*ආ*) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(*ඇ*) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(*ඈ*) ස්ත්‍රී /පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක .

(*ඉ*) **2026.11.09** දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

(*ඊ*) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය **2026.11.09** දිනට පෙර දිනයක් විය යුතු ය.

(*උ*) සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය වන විට ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතු ය.

4. *අයදුම්කළ යුතු ආකාරය -*

(*අ*) මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතු ය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතු ය. අයදුම්පතේ අනු අංක 01 සිට 14 දක්වා පළමු පිටුවේ ද අනු අංක 15 සිට 17 දක්වා දෙවන පිටුවේ ද අනු අංක 18 තෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතු ය.

(*ආ*) උපාධි සහතිකයේ හා GPA අගය දැක්වෙන විස්තරාත්මක ප්‍රතිඵල සහතිකයේ තමා විසින් සත්‍ය බවට සහතික කරනු ලැබූ පිටපතක් බැගින් අයදුම්පතට ඇමිණිය යුතු ය.

(*ඇ*) අයදුම්කරුවන් රු.1,000.00 ක මුදලක් ලංකා බැංකුව තැපොබේන් ශාඛාවේ අංක 7041318 දරන, "සෞඛ්‍ය ලේකම් - විභාග ගාස්තු රැස්කිරීම" ගිණුමට බැර කර අදාළ ලදුපත අයදුම්පතෙහි කොටුව තුළ ඇලවිය යුතු ය. එම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

(*ඈ*) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු හෝ අයදුම්කරුවන් තම අයදුම්පත, ආයතන ප්‍රධානියා මගින් අත්සන සහතික කර ඉදිරිපත් කළ යුතු ය. අනෙකුත් අයදුම්කරුවන් අයදුම්පතෙහි තම අත්සන, තම කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා / රජයේ පාසලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධරයෙකු / බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු / රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා සහතික කර ඉදිරිපත්

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

කළ යුතු ය. ශ්‍රී ජයවර්ධනපුර රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය රෝහල වැනි රජයට අනුබද්ධ රෝහල්වල දැනට සේවයේ නියුතු උපාධිධාරීන් තම රෝහල් ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2026" වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර අධ්‍යක්ෂ (පාලන) - 01, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 ලිපිනයට 2026.11.09 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

5. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින් සිය අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එසේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බවත් අදාළ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් සිහි තබාගත යුතු ය.

6. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා 2026.11.09 දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

7. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් / අයදුම්කාරියන් අතුරින් ඔවුන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කර ගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හෙද ව්‍යවස්ථාවේ හා මෙම නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ

*සටහන :-*

(අ) සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවා ගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

(ආ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි සඳහන් වගන්ති කිසිවකින් අදහස් නොවන අතර, එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ නුසුදුසු වූ හා තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු www.health.gov.lk යන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පමණක් පළකරනු ලබන අතර, කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

8. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය;

(ආ) උපාධි සහතිකයේ මුල් පිටපත සමග GPA අගය දැක්වෙන විස්තරාත්මක ප්‍රතිඵල සහතිකය හා තමා විසින් එම ලේඛන සත්‍ය බවට සහතික කරනු ලැබූ පිටපත.

(ඇ) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හා තමා විසින් සත්‍ය බවට සහතික කරනු ලැබූ එහි පිටපත.

(ඈ) ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචි වූ බවට අදාළ ලිපිලේඛන.

9. පුහුණු කිරීමේ පටිපාටිය -

| *පාඨමාලාව* | *පාඨමාලා කාලසීමාව* | *භාෂා මාධ්‍යය* |
|---|---|---|
| හෙද අනුස්ථාපන හා සමායෝජන | මාස 06 | ඉංග්‍රීසි |

(අ) තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අදාළ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට අනුයුක්ත කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි භාෂාවෙන් හැදෑරිය යුතු ය.

(ආ) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

Gazette.lk

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය අවසානයේ දී සාර්ථකව එය නිම නොකරන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැක.

(ඈ) පුහුණුව ලබන කාල පරිච්ඡේද තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි දැක්වෙන විධිවිධානවලට යටත්ව සිසු හෙද / හෙදියන්ට තෙවන වසරේදී ලබාදෙන මාසික දීමනාව ලබා දෙනු ඇත.

(ඉ) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අතහැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලද හොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාල පරිච්ඡේදයක් අදාළ පළාත් සභාවට හෝ රේඛීය අමාත්‍යාංශයට අයත් පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකු සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු අතර, එම ගිවිසුම හා ඇපකරය පුහුණුවට ලියාපදිංචිය ලබන දිනයේ ම අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ශාඛාව වෙත භාරදිය යුතු ය. පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැර ගියහොත් හෝ ඉහත (ඇ) වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදු වුවහොත් හෝ පත්වීම ලැබ වර්ෂ පහක (05) කාල පරිච්ඡේදයක් අදාළ පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පුහුණු කාලය තුළ දී ඔහුට / ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහු / ඇය විසින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් ආපසු අය කර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :*

පුහුණුව අවසානයේ අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදු කරන / නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්ව ය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක / අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු අනුව 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MT-7-2025 වැටුප් කේතයට අදාළ වැටුප් පරිමාණයේ (රු. 54,920- 10×800- 11×1,190- 10×1,320- 10×1,350- රු. 102,710) උපලේඛන III හි සඳහන් පරිදි 04 වන පියවරේ තබා වැටුප් ගෙවීම මත III ශ්‍රේණියේ හෙද නිලධාරි තනතුරට පත්කිරීමට කටයුතු කෙරේ.

11. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන අතර, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර තනතුරින් පහ කිරීම හෝ පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. තව ද ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර, නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළදී ඔහුට / ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන් / ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

13. මෙම පුහුණු කාල සීමාව තුළදී වෘත්තීය සමිති කටයුතුවල යෙදීමට හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කළ බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු සිදු කරනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ සේවකයින්ට අදාළ වන සියලුම නීති රීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට, මුදල් රෙගුලාසිවලට, හෙද සේවා ව්‍යවස්ථාවට හා එයට වරින් වර සිදු කරනු ලබන සංශෝධනවලට හා කලින් කලට බලපවත්නා රජයේ පොදු රෙගුලාසිවලට යටත් වනු ඇත.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

15. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබා දෙන්නේ නම් ඒ සඳහා තක්සේරු නිවාස හා කාමර කුලිය, ජලය හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදාවුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,**
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

2026 ඔක්තෝබර් මස 05 දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

| අයදුම්පත් අංකය | |
|---|---|

**ආදර්ශ අයදුම්පත්‍රය**

හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා
විද්‍යාවේදී (හෙද) උපාධිධාරීන් බඳවා ගැනීම - 2026.

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය හොඳින් කියවා බලන්න.

| | | |
|---|---|---|
| 01. | මුලකුරු සමඟ අගට යෙදෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | |
| 02. | සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | |
| 03. | සම්පූර්ණ නම : සිංහලෙන් /දෙමළෙන් | |
| 04. | ජාතික හැඳුනුම්පත් අංකය : | |
| 05. | ජංගම දුරකතන අංකය (WhatsApp සහිත) : | |
| 06. | තැපැල් ලිපිනය : | |
| 07. | ස්ථිර ලිපිනය : | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 08. | පදිංචි දිස්ත්‍රික්කය : | | 09. | ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි කරුවෙක් ද? | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10. | උපන් දිනය : | වර්ෂය | | මාසය | | දිනය |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11. | 2026.11.09 දිනට වයස | අවු: | | | මාස: | | | දින: | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12. | ස්ත්‍රී/ පුරුෂභාවය (☑ සලකුණ යොදන්න) | ස්ත්‍රී | | පුරුෂ | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13. | ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග (☑ සලකුණ යොදන්න) | ඔව් | | නැත | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14. | අධ්‍යාපන සුදුසුකම් : | | | | |
| | *සමත් වූ උපාධිය* | *උපාධිය වලංගු වන දිනය* | *ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA)* | *විශ්වවිද්‍යාලය* | *අධ්‍යයන වර්ෂය* |
| | | | | | |
| | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15. | ඔබ කවදා හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවී තිබේ ද? | ඔව් | | නැත | |
| | (☑ සලකුණ යොදන්න)<br>පිළිතුර 'ඔව්' නම් ඒ පිළිබඳ විස්තර | | | | |

16. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් අයදුම්පත් කැඳවීමේ නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවත් මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන්කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලද හොත් ඉන් අනතුරුව එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත්වන බව ද මම දැන සිටිමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, මට අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, හොඳින් අවබෝධ කරගෙන සිටින බවත් ප්‍රකාශකර සිටිමි.

| |
|---|
| රු. 1,000.00 ගෙවා ලබා ගත් බැංකු ලදුපත මෙහි අලවන්න |

………………….., ……………………………………,

දිනය අයදුම්කරුගේ අත්සන

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................... මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද ඔහු / ඇය .................................. දින ................................ දී මා ඉදිරිපිට ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

දිනය : ............................ .................................................................,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.

අත්සන සහතික කරන්නාගේ නම : ......................................................

තනතුර : .....................................................

ලිපිනය : ......................................................

18. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න).

ඉහත අයදුම්කරු / අයදුම්කාරිය වන ............................................................................................ මහතා / මහත්මිය / මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ............................................ තනතුර දරන බව මින් සහතික කරමි.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, පුහුණුව සඳහා තෝරා ගතහොත් ඔහු / ඇය නිදහස් කළ හැකි / නොහැකි බව දන්වමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත් ඔහු/ඇය අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

දිනය : ............................ ...................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම : .....................................................

තනතුර : .....................................................

ලිපිනය : .....................................................

10 - 523

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED